සියලුම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 25 - ශ්‍රී ලංකා ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

## 25 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | 01 x 40 | = | 40 |
| II පත්‍රය | | | |
| | අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| | සෙසු ප්‍රශ්න 3 කට 14 බැගින් | = | 42 |
| | II පත්‍රය අවසාන ලකුණු | = | 60 |
| | අවසාන ලකුණු | = | 40 + 60 = 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ..................................................<br>.................................................. | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ..................................................<br>.................................................. | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ..................................................<br>.................................................. | √ | △ $\frac{3}{5}$ |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ඉතිහාසය I (I කොටස)
வரலாறு I (பகுதி I)
History I (Part I)

**25 S I**

2018.08.27 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**විභාග අංකය:** ..................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) හරිවංසය (2) දීපවංසය (3) බෝධිවංසය (4) ථූපවංසය (5) ධාතුවංසය (.........)

**2.** (1) තැප්‍රොබේන් (2) සිමුන්ඩු (3) සෙරන්ඩිබ් (4) තම්බරට්ය (5) සෙයිලාන් (.........)

**3.** (1) නන්දිමිත්ත (2) ඵුස්සදේව (3) දීඝජන්තු (4) වේළුසුමන (5) ගෝඨයිම්බර (.........)

**4.** (1) පේද්‍රෝ ලෝපේස් ද සූසා (2) ජෙරොනිමෝ ද අසවේදු
(3) කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා (4) පිලිප් ද ඔලිවේරා
(5) දියෝගු ද මේලෝ ද කැස්ත්‍රෝ (.........)

**5.** (1) ඩී. එස්. සේනානායක (2) ඔලිවර් ගුණතිලක (3) ඩඩ්ලි සේනානායක
(4) ජෝන් කොතලාවල (5) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක (.........)

● අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**6.** (1) කදම්බ නදී - මල්වතු ඔය
(2) මහා නදී - ඇදුරු ඔය
(3) ගෝණ නදී - කලා ඔය
(4) වන නදී - වලවේ ගඟ
(5) කප්පකන්දර නදී - මැණික් ගඟ (.........)

**7.** (1) මෙගස්තීනිස් - ග්‍රීක
(2) ප්‍රොකෝපියස් - රෝම
(3) හියුං ත්සාං - චීන
(4) මාර්කෝ පෝලෝ - පර්සියානු
(5) ඉබ්න් බතූතා - අරාබි (.........)

**8.** (1) බුද්ධදාසරින්ද - බුද්ධදාස ළපරිදෙව
(2) මහාසේන - මින්නේරි දෙවියෝ
(3) නිශ්ශංකමල්ල - කාලිංග චක්‍රවර්ති
(4) දෙවන පරාක්‍රමබාහු - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත
(5) හයවන පරාක්‍රමබාහු - ෂඩ් භාෂා පරමේශ්වර (.........)

**9.** (1) සිල්වත් සමාගම - වැලිවිට සරණංකර හිමි
(2) සයිව ප්‍රගාස සබෙයි - ආරුමුග නාවලර්
(3) බෞද්ධ පරමවිඥානාර්ථ සමාගම - හෙන්රි ස්ටීල් ඕල්කොට්
(4) රාමක්‍රිෂ්ණ මිසම - නටේස අයියර්
(5) මහාබෝධි සමාගම - අනගාරික ධර්මපාල (.........)

**10.** (1) 1815 - රාජ්‍ය ඉඩම් ලියාපදිංචි කිරීමේ ආඥාපනත
(2) 1856 - විහාරගම් ආඥාපනත
(3) 1872 - ධාන්‍ය බදු ආඥාපනත
(4) 1897 - මුඩුබිම් ආඥාපනත
(5) 1935 - ඉඩම් සංවර්ධන ආඥාපනත (.........)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීර... දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**11.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ගොඩවාය සෙල්ලිපිය | A | ගමක පාලනය සඳහා වූ නීතිරීති |
| (ii) | සිතුල්පව්ව සෙල්ලිපිය | B | වරායකින් ලබා ගන්නා ලද තීරුබදු |
| (iii) | කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය | C | පළමුවන විජයබාහු රජතුමා විසින් ශ්‍රී පාදස්ථානයට ඉඩම් පූජා කිරීම |
| (iv) | අඹගමුව සෙල්ලිපිය | D | කිත් නුවරගල් සේනාපතියාට ගම්වරයක් පිරිනැමීම |
| (v) | දෙවනගල සෙල්ලිපිය | E | උසාවියකට ලැබුණු දඩ මුදල් සංඝයාට පිරිනැමීම |

(1) BEACD (2) CBDAE (3) CDAEB (4) DEACB (5) EDABC (.........)

**12.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | හත්තොට අමුණ | A | වලවේ ගඟ |
| (ii) | ඇළහැර අමුණ | B | අඹන් ගඟ |
| (iii) | මිණිපේ අමුණ | C | කළු ගඟ |
| (iv) | වැන්කැටි අමුණ | D | මහවැලි ගඟ |
| (v) | කොට්ඨබද්ධ අමුණ | E | ඇඳුරු ඔය |

(1) BEACD (2) CBDAE (3) CDAEB (4) DEACB (5) EDABC (.........)

**13.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | විජයබාහු පිරිවෙන | A | රයිගම |
| (ii) | පද්මාවතී පිරිවෙන | B | මුල්කිරිගල |
| (iii) | ශ්‍රී ඝනානන්ද පිරිවෙන | C | පැපිලියාන |
| (iv) | සුනේත්‍රාදේවි පිරිවෙන | D | තොටගමුව |
| (v) | ඉරුගල්කුලතිලක පිරිවෙන | E | කැරගල |

(1) BEACD (2) CBDAE (3) CDAEB (4) DEACB (5) EDABC (.........)

**14.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | උඩරට රාජ්‍යයේ පළමුවන පාලකයා | A | ෆෙඩ්රික් නෝර්ත් |
| (ii) | පළමුවන ලන්දේසි ආණ්ඩුකාරවරයා | B | හෙන්රි මන්ක් මේසන් මුවර් |
| (iii) | පළමුවන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා | C | විලියම් ගොපල්ලව |
| (iv) | පළමුවන අග්‍රාණ්ඩුකාරවරයා | D | විලෙම් ජේ. කෝස්ටර් |
| (v) | ලංකාවේ පළමුවන ජනාධිපතිවරයා | E | සේනා සම්මත වික්‍රමබාහු |

(1) BEACD (2) CBDAE (3) CDAEB (4) DEACB (5) EDABC (.........)

**15.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | පහතරට නිෂ්පාදන සංගමය | A | එස්. ඒ. වික්‍රමසිංහ |
| (ii) | හලාවත සංගමය | B | වික්ටර් කොරයා |
| (iii) | ලංකා ජාතික සංගමය | C | චාල්ස් ද සොයිසා |
| (iv) | ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය | D | පොන්නම්බලම් අරුණාචලම් |
| (v) | සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය | E | ජී. ජී. පොන්නම්බලම් |

(1) BEACD (2) CBDAE (3) CDAEB (4) DEACB (5) EDABC (.........)

- අංක **16** සිට **20** තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**16. පැරණි හා මධ්‍යතන ශ්‍රී ලංකාවේ අගනගරවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, දඹදෙණිය, යාපහුව
(2) අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, යාපහුව
(3) අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල
(4) අනුරාධපුර, දඹදෙණිය, පොළොන්නරුව, යාපහුව, කුරුණෑගල
(5) අනුරාධපුර, යාපහුව, පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල (.........)

**17. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ආක්‍රමණ හා සම්බන්ධ සෙල්ලිපි අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) දෙවනගල, ආර්පාක්කම්, පල්ලවරායන් පෙට්ටෙ, සංගමු විහාර
(2) දෙවනගල, ආර්පාක්කම්, පල්ලවරායන් පෙට්ටෙ, රාමේශ්වරම්
(3) දෙවනගල, ආර්පාක්කම්, රාමේශ්වරම්, විජයනගර
(4) දෙවනගල, ආර්පාක්කම්, සංගමු විහාර, රාමේශ්වරම්
(5) දෙවනගල, ආර්පාක්කම්, පල්ලවරායන් පෙට්ටෙ, තිරුවාලංගාඩු (.........)

**18. දහසයවන සියවසෙන් පසු ශ්‍රී ලංකාවේ ඉතිහාසය අන්තර්ගත ග්‍රන්ථවල කතුවරුන්ගේ නම් අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) රිබෙයිරෝ, ක්වේරොස්, මාට්සුයිකර්, බාර්න්ස්
(2) රිබෙයිරෝ, ක්වේරොස්, වැලන්ටයින්, බල්දෙයස්
(3) රිබෙයිරෝ, ක්වේරොස්, වැලන්ටයින්, මේට්ලන්ඩ්
(4) රිබෙයිරෝ, ක්වේරොස්, අල්මේදා, බල්දෙයස්
(5) රිබෙයිරෝ, වැලන්ටයින්, බල්දෙයස්, ටොරිංටන් (.........)

**19. සිංහලයන් විසින් පෘතුගීසීන්ට එරෙහිව කරන ලද සටන් අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) මුල්ලේරියා, දන්තුරේ, බලන, වෙල්ලස්ස
(2) දන්තුරේ, බලන, රන්දෙණිවෙල, වෙල්ලස්ස
(3) මුල්ලේරියා, බලන, රන්දෙණිවෙල, කටුවන
(4) බලන, රන්දෙණිවෙල, ගන්නොරුව, වෙල්ලස්ස
(5) මුල්ලේරියා, දන්තුරේ, බලන, රන්දෙණිවෙල (.........)

**20. දේශපාලන පක්ෂ ආරම්භ වූ වර්ෂ අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) ලංකා සමසමාජ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ඉලංගෙයි තමිල් අරසුකච්චි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ
(2) ලංකා සමසමාජ පක්ෂය, ඉලංගෙයි තමිල් අරසුකච්චි, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ
(3) ඉලංගෙයි තමිල් අරසුකච්චි, එක්සත් ජාතික පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ
(4) ලංකා සමසමාජ පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, ඉලංගෙයි තමිල් අරසුකච්චි, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
(5) එක්සත් ජාතික පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ඉලංගෙයි තමිල් අරසුකච්චි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ

(.........)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. අනුරාධපුර රාජධානියේ පාලනය**

(1) රජතුමා සමස්ත පරිපාලන යාන්ත්‍රණයේම කේන්ද්‍රය විය.
(2) අනුරාධපුර සියලුම රජවරු මෞර්ය පෙළපතට අයත්වූහ.
(3) න්‍යායාත්මකව රජතුමා යුක්තිධර්මයේ උල්පත විය.
(4) න්‍යායාත්මකව රජතුමා භූපති ලෙස පිළිගැණුනි.
(5) රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම් ය. (.........)

**22. අභයගිරිය**

(1) අභයගිරි විහාරය වළගම්බා රජු විසින් කරවන ලදී.
(2) අභයගිරි විහාරය බෞද්ධ අධ්‍යයනය පිළිබඳ සුප්‍රසිද්ධ මධ්‍යස්ථානයක් විය.
(3) ථෙරවාද හා මහායාන ග්‍රන්ථ අභයගිරියෙහි හදාරණු ලැබී ය.
(4) අභයගිරි විහාරයෙහිදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී.
(5) චීන සංචාරක ෆාහියන් භික්ෂුව අභයගිරිය විහාරයෙහි නේවාසිකව වැඩසිටියහ. (.........)

**23. ගම්පොළ රාජධානිය**

(1) ගම්පොළ සිට පාලනය කළ පළමුවන පාලකයා හතරවන භුවනෙකබාහු රජතුමා ය.
(2) සේනාලංකාධිකාර හා අළගක්කෝනාර එකල සිටි ප්‍රධාන ප්‍රභූ පවුල් දෙකක් විය.
(3) කෝකිල සන්දේශය හා පරෙවි සන්දේශය ගම්පොළ අවධියේදී රචනා කරනු ලැබී ය.
(4) යාපනයේ ආර්යචක්‍රවර්ති පාලකයා ගම්පොළ රාජධානිය ආක්‍රමණය කළ බවට සාක්ෂි තිබේ.
(5) ගඩලාදෙණිය විහාරය ගණේශ්වරාචාර්යගේ නිර්මාණයකි. (.........)

**24. සීතාවක රාජධානිය**

(1) 1521 විජයබා කොල්ලයෙන් පසු ආරම්භ විය.
(2) මායාදුන්නේ පළමුවන පාලකයා විය.
(3) රයිගම් බණ්ඩාරගේ මරණින් පසු රයිගම සීතාවක රාජ්‍යයට ඈඳා ගන්නා ලදී.
(4) 1582 දී උඩරට ප්‍රදේශය සීතාවක රාජ්‍යයට ඈඳා ගන්නා ලදී.
(5) 1619 දී යාපනය රාජ්‍යය සීතාවක රාජ්‍යයට ඈඳා ගන්නා ලදී. (.........)

**25. 1815 උඩරට ගිවිසුම**

(1) උඩරට ප්‍රධානීන් හා බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විසින් අත්සන් කරන ලද ගිවිසුමකි.
(2) නායක්කර් පෙළපතට උඩරට සිහසුනට තිබූ අයිතිය අහෝසි කරන ලදී.
(3) ජෝර්ජ් ටර්නර් උඩරට පළාත්වල ආණ්ඩුකාරවරයා ලෙස පත් කරන ලදී.
(4) පස්වන වගන්තියෙන් බුද්ධාගම ආරක්ෂා කරන බවට පොරොන්දු දෙනු ලැබී ය.
(5) උඩරට ප්‍රධානීහු සිංහල හා දෙමළ යන භාෂාවලින් අත්සන් කළහ. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
  **(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
  **(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
  **(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
  **(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
  ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............ **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

**26.** **ශ්‍රී ලංකාවේ බුද්ධාගම පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) මහින්ද හිමියන්ගේ පැමිණීම
(B) භික්ෂු-භික්ෂුණී සාසන පිහිටු වීම
(C) මහමෙව්නා උයන සංඝයා වහන්සේලාට පූජා කිරීම
(D) අනුලා බිසව භික්ෂුණියක් ලෙස සසුන්ගත වීම (.........)

**27.** **යාපහුව රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) යාපහුව සුභ පබ්බත නමින් හැඳින්වේ.
(B) පළමුවරට යාපහුවෙහි පාලන මධ්‍යස්ථානයක් පිහිටුවන ලද්දේ සංඛ සෙනෙවියා විසිනි.
(C) පළමුවන බුවනෙකබාහු රජතුමා ඊජිප්තුවේ සුල්තාන්වරයා වෙත දූත පිරිසක් පිටත් කර යැවී ය.
(D) යාපහුවෙහි ගෘහ නිර්මාණ කෘතීන් සම්බන්ධයෙන් දැඩි චෝළ බලපෑමක් දැකිය හැකි ය. (.........)

**28.** **හයවන පරාක්‍රමබාහු රජතුමාගේ කාර්යසිද්ධිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) හයවන පරාක්‍රමබාහු රජතුමා දිවයින එක්සේසත් කළේ ය.
(B) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ අගනගරය විය.
(C) හයවන පරාක්‍රමබාහු රජතුමා චීන අද්මිරාල් චෙං හෝ පරාජය කළේය.
(D) හයවන පරාක්‍රමබාහු රජතුමා දෙවිනුවර උපුල්වන් දේවාලය කරවිය. (.........)

**29.** **ආරුමුග නාවලර් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ආරුමුග නාවලර් දහනවවන සියවසේ ඇති වූ හින්දු පුනරුදයේ නායකයා විය.
(B) ආරුමුග නාවලර් හෙන්රි ස්ටීල් ඕල්කට් සමඟ සමීප සබඳතා පැවැත් විය.
(C) ආරුමුග නාවලර් සයිවන්ගල විද්‍යාසාලෙයි පිහිටු විය.
(D) ආරුමුග නාවලර් අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයකු විය. (.........)

**30.** **ඩී. බී. ජයතිලක සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ඩී. බී. ජයතිලක නාලන්ද විද්‍යාලයේ විදුහල්පතිවරයකු ලෙස සේවය කළේ ය.
(B) ඩී. බී. ජයතිලක අමද්‍යප නායකයකු විය.
(C) ඩී. බී. ජයතිලක ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමුවැනි සභානායකවරයා විය.
(D) ඩී. බී. ජයතිලක එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමට මූලිකත්වය ගත්තේ ය. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** **කන්තලේ වැව කරවන ලද්දේ කවුරුන් විසින් ද?**
(1) දෙවන ජෙට්ඨතිස්ස රජතුමා (2) දෙවන උපතිස්ස රජතුමා (3) දෙවන මොග්ගල්ලාන රජතුමා
(4) දෙවන අග්ගබෝධි රජතුමා (5) දෙවන සේන රජතුමා (.........)

**32. අමාවතුර නම් ග්‍රන්ථයේ කතුවරයා කවු ද?**

(1) ගුරුළුගෝමි  (2) විද්‍යාචක්‍රවර්ති  (3) පරාක්‍රම පණ්ඩිත
(4) සාරිපුත්ත හිමි  (5) මේධංකර හිමි  (.........)

**33. ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් 1762 දී උඩරට රාජ්‍යය වෙත එවන ලද රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයා කවු ද?**

(1) රොබට් නොක්ස්  (2) ජෝන් පයිබස්  (3) හියු බොයිඩ්
(4) රොබට් ඇන්ඩෲස්  (5) ජෝන් ඩොයිලි  (.........)

**34. විද්‍යාලංකාර පිරිවෙනේ නිර්මාතෘවරයා කවු ද?**

(1) වලානේ සිද්ධාර්ථ හිමි  (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(3) දොඩන්දූවේ පියරතන හිමි  (4) රත්මලානේ ධර්මාලෝක හිමි
(5) වැලිවිටියේ සෝරත හිමි  (.........)

**35. දහනව වන සියවසේ පසුභාගයේ ඇති වූ ඉස්ලාමීය පුනරුදයේ මුඛ්‍ය පුද්ගලයා කවු ද?**

(1) එම්. සී. සිද්දි ලෙබ්බෙ  (2) අරාබි පාෂා  (3) වාපුච්චි මරික්කාර්
(4) ටී. බී. ජයා  (5) බදියුද්දීන් මහමුද්  (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | විජය රජතුමා ස්වකීය අගනගරය අනුරාධපුරයෙහි පිහිටුවිය. | මහාසේන රජතුමා ආලකමන්දාවේ කුවේරයා මෙන් වාසය කළැයි මහාවංසය සඳහන් කරයි. | (.........) |
| **37.** | කාලිංග මාඝගේ ආක්‍රමණය අනුරාධපුර රාජධානියේ බිඳවැටීමට මඟ පෑදී ය. | පළමුවන විජයබාහු රජතුමා ඇළහැර ඇළ හා මින්නේරිය වැව ඇතුළු වාරි කෘති බොහොමයක් ප්‍රතිසංස්කරණය කළේ ය. | (.........) |
| **38.** | දහතුන්වන සියවසේදී රජරට ශිෂ්ටාචාරයේ බිඳවැටීම ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය. | දහතුන්වන සියවසෙන් පසු පාලන මධ්‍යස්ථානය දඹදෙණියේ සිට නිරිතදිගට විතැන්වූ අතර ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පරිහානියට පත්වීම ආරම්භ විය. | (.........) |
| **39.** | ලන්දේසීහු තේසවලමෙයි මගින් දෙමළ ජනතාවගේ නීති හා චාරිත්‍ර වාරිත්‍ර සංග්‍රහගත කළේ ය. | 1765 දී ලන්දේසීන්ගේ උඩරට ආක්‍රමණය යාන් ෂ්‍රොයිඩර් විසින් සිදු කරන ලදී. | (.........) |
| **40.** | බණ්ඩාරනායක මැතිනියගේ පළමුවන ආණ්ඩුව යටතේ රජයේ ආධාර ලැබූ පාසල් බොහෝමයක් රාජ්‍ය පාලනය යටතට පත් කරන ලදී. | සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම 1964 දී අත්සන් කරන ලදී. | (.........) |

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: 25

විෂයය / பாடம்: ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 1 | 21. | 2 | 31. | 4 |
| 02. | 4 | 12. | 2 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 3 | 33. | 2 |
| 04. | 4 | 14. | 5 | 24. | 5 | 34. | 4 |
| 05. | 2 | 15. | 2 | 25. | 3 | 35. | 1 |
| 06. | 2 | 16. | 3 | 26. | 5 | 36. | 3 |
| 07. | 4 | 17. | 5 | 27. | 4 | 37. | 4 |
| 08. | 5 | 18. | 2 | 28. | 1 | 38. | 5 |
| 09. | 4 | 19. | 5 | 29. | 4 | 39. | 1 |
| 10. | 1 | 20. | 1 | 30. | 2 | 40. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

| ඉතිහාසය I<br>வரலாறு I<br>History I | 25 | S |
|---|---|---|

| ප්‍රශ්න අංකය<br>வினா இல.<br>Question No. | 1 |
|---|---|

| විභාග අංකය<br>சுட்டெண்<br>Index No. | ................................ |
|---|---|



## II කොටස

1. **ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

| | | | |
|---|---|---|---|
| (i) වලවේ ගඟ | (ii) ඌරාතොට | (iii) කැලණිය | (iv) නාච්චදූව වැව |
| (v) කුරුණෑගල | (vi) කොට්ටියාරම | (vii) බදුල්ල | (viii) උතුරු පළාත |

**(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු *01* බැගින්; කෙටි ඓතිහාසික සටහනකට *(ලකුණු 05 බැගින්)***

2. **'මහාවංසය මහාවිහාරයේ වංසකථාවයි.'**

**(i) මහාවංසයට ලියන ලද ටීකාව නම් කරන්න.**

වංසත්ථප්පකාසිනිය **(ලකුණු 01 යි)**

**(ii) මහාවිහාරයට අයත් වූ ප්‍රධාන උපොසථඝරය හා ප්‍රධාන ස්තූපය නම් කරන්න.**

ලෝහ ප්‍රාසාදය හෙවත් ලෝවාමහාපාය / මහා ථූපය හෙවත් රුවන්වැලිසෑය

**(ලකුණු 02 යි)**

**(iii) මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක්, මහාවංසයේ අඩංගු දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු, සෙල්ලිපිවලින් තහවුරු වන අයුරු සැකෙවින් දක්වන්න.**

- ❖ මෙරට සෙල්ලිපි පිහිටුවීම ආරම්භය සිදු වූ දේවානම්පියතිස්ස රජ සමයේ සිට මහසෙන් රජුගේ කාලය වන තෙක් වූ අවධියේ බලයට පත් රජවරුන් අනුපිළිවෙල, ඔවුන් අතර පැවති ඥාති සබඳතා, ඔවුන්ගේ රාජ්‍ය වර්ෂ ආදී වූ කරුණු රැසක් සෙල්ලිපි විශාල ප්‍රමාණයකින් තහවුරු වන ආකාරය සාකච්ඡාවට භාජනය කළ යුතුය. උදා: පාලුමැකිච්චාව, කුසලාන්කන්ද, තෝණිගල, තිඹිරිවැව
- ❖ එම දේශපාලන කටයුතුවලට සම්බන්ධව සිටි විශාල නිලධාරීන් පිරිසක් පිළිබඳවද සෙල්ලිපිවලින් වාර්තා වේ.
- ❖ සෙල්ලිපිවල පැතිරීමට අනුව ඒ ඒ පාලකයන්ගේ බලය ව්‍යාප්තව පැවති ප්‍රදේශය ආදී කරුණු පිළිබඳවද අවබෝධයක් ලබාගත හැකිය. උදා: සිතුල්පව්ව

**[මෙලෙස මහාවංසයේ අන්තර්ගත දේශපාලන ඉතිහාසය සම්බන්ධයෙන් වන කරුණු සෙල්ලිපිවලින් පැහැදිලි වන ආකාරය විස්තර කිරීම අපේක්ෂා කෙරේ.]**

**(ලකුණු 04 යි)**

**(iv) මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක් මහාවංසය මහාවිහාරයේ වංසකථාව ලෙස සැලකීම කොතෙක් දුරට සාධාරණ ද?**

- ❖ මහාවංසය රචනා කරන ලද්දේ මහා විහාරවාසී භික්ෂුවක වන මහානාම හිමියන් විසිනි. මෙය රචනා කරන ලද්දේ මහසෙන් රජු මහා විහාරය විනාශ කිරීමෙන් අනතුරුව එහි පුනර්ජීවනයක් ඇති වූ අවධියකදීය. මේ වනවිට මහාවිහාරයේ ප්‍රතිවාදියා වූ අභයගිරිය දෙස් විදෙස් අවධානය දිනාගනිමින් පෙරට පැමිණ තිබූ බැවින් මහාවිහාරයේ අතීත ශ්‍රී විභූතිය මහාවංසයේ විශේෂ අවධානයට යොමු කරන ලදැයි සිතිය හැකිය.

- ❖ දිවයිනේ බුදු සසුන පිහිටුවීම, මහාවිහාරය ඉදිකිරීම, ඊට අයත් විවිධ ගොඩනැගිලි ඉදිකිරීම වැනි කරුණු ගැන මහාවංසයේ ඉතා දීර්ඝ ලෙස තොරතුරු විස්තරකොට තිබේ.

- ❖ මහාවංසය, දිවයිනේ ආගමික ඉතිහාසය මහාවිහාරයට සම්බන්ධ කොට ඇති බව පෙනේ.

- ❖ එකී කාරණා සලකා බලන විට මහාවංසය මහාවිහාරයේ වංසකථාව ලෙසට සැලකිය හැකි නමුත් මෙහි ඉන් බැහැර, දිවයිනේ දේශපාලන, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ඉතිහාසයට අදාළ බොහෝ කරුණු ගෙනහැර දක්වා ඇති බවද පෙනේ.

- ❖ එවැනි තොරතුරු සෙල්ලිපි හා වෙනත් මූලාශ්‍රය මගින් සනාථ වී තිබේ. එබැවින් අඩුපාඩු සහිත වුවත් මහාවංසය යනු මහාවිහාරයේ වංසකථාවම නොව අදාළ කාලපරිච්ඡේදයේ දිවයිනේ ඉතිහාසය ගෙනහැර දක්වන කෘතියක්ද වන බව නිගමනය කළ හැකිය.

**[කෙසේවෙතත් පිළිතුරු ලිවීමේදී අවසන් නිගමනයේදී ප්‍රස්තුත ප්‍රකාශයට පක්ෂව හෝ විපක්ෂව කරුණු ගෙනහැර දක්වීම සිදුකළ හැකි අතර එහිදී සැලකිල්ලට ගත යුත්තේ එකී නිගමනය සඳහා ප්‍රමාණවත් මූලාශ්‍රයගත සාක්ෂි ඉදිරිපත් කර ඇද්ද යන්නයි.]**

**(ලකුණු 07 යි)**

**3. දුටුගැමුණු රජතුමා විසින් ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සඳහා ගෙනගිය ක්‍රියාමාර්ගයට කාවන්තිස්ස රජුගෙන් ලද දායකත්වය ප්‍රමාණ කරන්න.**

- ❖ කාවන්තිස්ස රජු පිළිබඳවත් දුටුගැමුණු රජුගේ කාර්ය සාඵල්‍යය ගැනත් කරුණු විමසීමේ දී ***මහාවංසය*** සැලකිය යුතු තොරතුරු සමුදායක් ලබාදෙයි. දුටුගැමුණු රජතුමා විසින් ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සඳහා ගෙනගිය ක්‍රියාමාර්ගයට කාවන්තිස්ස රජුගෙන් ලැබුණු දායකත්වය ප්‍රමාණ කිරීම සඳහා අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රයවල තොරතුරුද වැදගත් වේ.

- ❖ එක්සත් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා දුටුගැමුණු රජු දියත් කළ යුද ව්‍යාපාරය සාර්ථක කර ගැනීම පිණිස කාවන්තිස්ස රජුගෙන් ප්‍රබල දායකත්වයක් ලැබුණු බව එබඳු මූලාශ්‍රය තුළින් තහවුරු වී ඇත:
  - ▪ විවාහ සබඳතා මගින් දකුණේ ප්‍රාදේශීය රාජ්‍ය සමග සබඳතා තර කර ගැනීම (උදා: කැලණිය හා ගිරිනුවර).
  - ▪ ආගමික සබඳතා මගින් නැගෙනහිර කලාපයේ සේරු, ලෝණ හා සෝම පාලන ඒකකවල අවනත බව ලබාගැනීම.
  - ▪ භික්ෂූන්ගේ අවවාද අනුශාසනා සිය පුත් කුමාරවරුන්ට ලබාදීමට කටයුතු කිරීම.
  - ▪ දකුණේ හා නැගෙනහිර ආගමික ස්ථාන දියුණු කරමින් භික්ෂූන්ගේ හා ජනතාවගේ ප්‍රසාදය දිනා ගැනීම.
  - ▪ එළාරගෙන් එල්ලවිය හැකි තර්ජනයන්ට මුහුණදීම සඳහා ආරක්ෂක විධිවිධාන සැලසීම:
    - ✓ දස මහා යෝධයන්ගෙන් සමන්විත වූ ශක්තිමත් චතුරංගනී සේනාවක් සංවිධානය කිරීම.
    - ✓ අවිආයුධ නිෂ්පාදනය හා එක් රැස් කිරීම.
    - ✓ දුටුගැමුණු-සද්ධාතිස්ස කුමාරවරු අතර ගැටුමක් ඇතිවුවහොත් අපක්ෂපාතීව ක්‍රියාකරන බවට හමුදාවෙන් ප්‍රතිඥා ලබාගැනීම.
    - ✓ සටන් කිරීම සම්බන්ධයෙන් දුටුගැමුණුගේ පැවති ආවේගශීලි අදහස් අවවාද මගින් සමනය කිරීම.
    - ✓ දීඝාභය කුමරු යොදවා කච්ඡතිත්ථ වැනි ආරක්ෂිත ස්ථානවල ආරක්ෂාව තර කරවීම.
  - ▪ සද්ධාතිස්ස කුමරු දිගාවැව හෙවත් දීඝවාපී ප්‍රදේශයට යවා එම කලාපය සශ්‍රීක කරවීම. **(ලකුණු 14 යි)**

**4. "පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය පුරාණ වාරිමාර්ග ඉතිහාසයේ උච්ඡතම අවස්ථාව සලකුණු කරයි." සාකච්ඡා කරන්න.**

- ❖ ආර්ය ජනාවාස ආරම්භයත් සමග වාරිකර්මාන්ත ඉදිකිරීම ආරම්භ වීම.
- ❖ වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය බවට පත්වූ අතර ඒ සඳහා අහස් දිය ප්‍රමාණවත් නොවීම.
- ❖ ගම් වැව් ඉදිකරවීම අනුරාධ ඇමතිවරයා විසින් ආරම්භ කරන ලද අතර වසභ රජු මහ වැව් කරවීම ඇරඹීම.
- ❖ වාරිකර්මාන්ත ඉදිකරවීමෙහිලා මහසෙන්, ධාතුසේන, I අග්ගබෝධි, II මුගලන් හා II අග්ගබෝධි වැනි රජවරුන් වැඩි දායකත්වයක් ලබාදීම.
- ❖ පොළොන්නරු යුගය වනවිට වාරි කටයුතු සමුද්‍ර සාගර තටාක සංකල්පය පදනම් කරගැනීම. එහිලා පළමුවන පරාක්‍රමබාහු රජුට සුවිශේෂ ස්ථානයක් හිමිවීම.
- ❖ මේ රජුගේ පාලන කාලය අතීත ශ්‍රී ලංකාවේ වාරිකර්මාන්ත ඉදිකිරීමේ උච්ඡතම අවස්ථාව සනිටුහන් කිරීම ("අහසින් වැටෙන එක දිය බිඳක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන අපතේ නොහැරිය යුතුය.").
- ❖ පළමුවන පරාක්‍රමබාහු රජුගේ වාරි කටයුතු අවධි දෙකක් යටතේ සිදුකළ බව හඳුනාගැනීම:
  - (1) දක්ඛිණ දේශයේ පාලකයාව සිටියදී දැදුරු ඔය ආශ්‍රිතව කරවූ වාරි කටයුතු (අමුණු - කොට්ඨ බද්ද, සූකරනිජ්ජර, දෝරදන්තික).
    - ✓ ගිංගග හා කළු ගඟ අතර පංඡයෝජනරට්ඨ ප්‍රදේශය සංවර්ධනය කිරීම.
    - ✓ පඬාවැව විශාල කොට සංවර්ධනය කිරීම.
    - ✓ දක්ඛිණ දේශයේ වැව් 53 ක් පිළිසකර කිරීම.
  - (2) මුළු දිවයිනේම පාලකයා වීමෙන් පසුව කරවන ලද වාරි කටයුතු
    - ✓ පරාක්‍රම සමුද්‍රය ඇතුළු සංකීර්ණ වැව් ජාලය, වැව් ඒකාබද්ධ කිරීම.
    - ✓ අංගමැඩිල්ල ඇළ හා හත්තොට ඇළ මාර්ග. කාලිංග ඇළ හා ගෝමතී ඇළ ව්‍යාපාරය. සැතපුම් 600 ක පමණ ඇළ මාර්ග සංවර්ධනය කිරීම.
    - ✓ වැව් ප්‍රතිසංස්කරණය කරවීම - මින්නේරිය, කවුඩුල්ල, ගිරිතලේ, කන්තලේ වැව්.
    - ✓ වංශකථාවලට අනුව මේ රජු ප්‍රධාන වැව් 163 ක්, කුඩා වැව් 2376 ක්, ඇළවේලි 165 ක්, ඇළමාර්ග 3910 ක්, බිසෝකොටු 341 ක් ඉදිකොට කැඩීබිඳී ගිය ඇළවේලි 1753 ක් පිළිසකර කොට තිබීම.

[මෙබඳු උදාහරණ දක්වමින් පුරාණ වාරිමාර්ග ඉතිහාසයේ උච්ඡතම අවස්ථාව පළමුවන පරාක්‍රමබාහු රජ සමය බව ඉස්මතුකොට දැක්වීම අපේක්ෂිතය.]

**(ලකුණු 14 යි)**

**5. දඹදෙණි යුගයේ වැදගත්කම පහත දැක්වෙන තේමා ඇසුරෙන් පරීක්ෂා කරන්න.**

**(i) දඹදෙණිය රාජධානිය පිහිටුවීම**

- ❖ දඹදෙණිය මෙරට තුන්වෙනි පාලන මධ්‍යස්ථානය වන අතර එය වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ උඩුකහ බස්නාහිර කෝරලේ ප්‍රදේශයට අයත් වීම.
- ❖ රාජධානි නිරිතදිගට සංක්‍රමණයවීමේදී තෝරාගත් මුල්ම රාජධානිය වීම. එම තෝරාගැනීම, පොළොන්නරු රාජධානිය කාලිංග මාඝගේ ග්‍රහණයට නතුවීමෙන් පසුව මෙරට හටගත් ව්‍යාකූල දේශපාලන වාතාවරණයෙන් මිදීමේ පළමු ප්‍රයත්නය වශයෙන් හඳුනාගත හැකිවීම.

- ❖ ප්‍රාදේශීය (වන්නි) පාලකයෙකු වශයෙන් සිටි තුන්වන විජයබාහු රජතුමා විසින් දඹදෙණිය පාලන මධ්‍යස්ථානය කරගැනීම.
- ❖ මේ රජුගේ ඇවෑමෙන් දෙවන පරාක්‍රමබාහු සහ හතරවන විජයබාහු යන පාලකයන් මෙන්ම කෙටි කලක් සඳහා පළමුවන භුවනෙකබාහු රජුද දඹදෙණිය ස්වකීය පාලන මධ්‍යස්ථානය කරගැනීම.
- ❖ ආරක්ෂාව සම්බන්ධයෙන් යෝග්‍ය ස්ථානයක පිහිටීම හේතුකොටගෙන දෙස් විදෙස් ආක්‍රමණික බලවේග මර්දනය කිරීමට දඹදෙණි පාලකයන් සමත්වීම.

**(ii) විදේශ ආක්‍රමණිකයන් පරාජය කිරීම**

- ❖ කාලිංග දේශයේ සිට පැමිණි ආක්‍රමණිකයෙකු වූ මාඝ, ක්‍රි.ව. 1215 දී එවකට පාලකයාව සිටි පරාක්‍රම පාණ්ඩ්‍ය ජීවිතක්ෂයට පත්කොට පොළොන්නරුව අල්ලාගෙන, එය පාලන මධ්‍යස්ථානය කොටගෙන දීර්ඝ කාලයක් දිවයිනේ රැඳී සිටි අතර දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජු ඔහුව පළවාහැරීමට සමත්වීම.
- ❖ අග්නිදිග ආසියාතික ප්‍රදේශයක සිට පැමිණ දෙවරක් ලංකාව ආක්‍රමණය කළ චන්ද්‍රභානු පරාජය කිරීම.
- ❖ පාණ්ඩ්‍ය ආක්‍රමණයක් ව්‍යර්ථ කිරීම.

**(iii) සංස්කෘතික ප්‍රබෝධය**

- ❖ දඹදෙණි යුගය මෙරට ඉතිහාසයේ කැපීපෙනෙන සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වූ අධියක් සේ සැලකීම.

**❖ ආගම හා බැඳුනු සංස්කෘතික ප්‍රබෝධයඃ**

- ▪ දළදාව ආරක්ෂා කරමින් පුදපූජා පැවැත්වීම (දළදා මැඳුරු ඉදිකිරීම, දළදා පූජා පැවැත්වීම, දළදා පෙරහැර පැවැත්වීම).
- ▪ ශාසන සංශෝධනය හා කතිකාවත් ඇති කිරීම (තුන්වන විජයබාහු කරවූ කතිකාවත හා දෙවන පරාක්‍රමබාහු රජු කරවූ දඹදෙණි කතිකාවත).
- ▪ අනුරාධපුර, පොළොන්නරු නගර ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු දිවයිනේ විවිධ ස්ථානවල වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය කිරීම (ගම්පොළ, කැලණිය, බෙලිගල, අත්තනගල්ල).
- ▪ රත්නපුර මහා සමන් දේවාලය ඉදිකිරීම.
- ▪ කඨින පූජෝත්සවය හා උපසම්පදාකර්ම පැවැත්වීම.
- ▪ පෙරහැර පැවැත්වීම (ඇසළ පෙරහැර හා බුදු පෙරහැර)

**❖ අධ්‍යාපනික දියුණුවඃ**

- ▪ තුන්වන විජයබාහු රජු ස්වකීය පුත්‍රයන්ට අධ්‍යාපනය ලබාදීමට උනන්දුවීම.
- ▪ දෙවන පරාක්‍රමබාහු රජු උගත් පඬිවරයෙකු වශයෙන් ග්‍රන්ථකරණයේ නිරතවීම (කව්සිළුමිණ, වනවිනිස සන්නය, විසුද්ධිමග්ග සන්නය). මේ රජු කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් හැඳින්වීම.
- ▪ පිරිවෙන් ඉදිකිරීම (දඹදෙණිය විජයසුන්දරාරාමය, කුරුණෑගල මහෙන්ද්‍රබාහු පිරිවෙන, වාකිරිගල). මෙබඳු පිරිවෙන් ශාස්ත්‍රීය මධ්‍යස්ථාන බවට පත්වීම.

**❖ සාහිත්‍ය ප්‍රබෝධය**

- ▪ සිංහල, පාලි, සංස්කෘත යන භාෂාවලින් රචිත සාහිත්‍ය කෘති ගණනාවක් බිහිවීම.
- ▪ උගත් භික්ෂු, ගිහි, පැවිදි පඬිවරු බිහිවීම නිසා විවිධ ක්ෂේත්‍ර අළලා ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ රැසක් රචනාවීම.
- ▪ බෞද්ධ ග්‍රන්ථ රැසක් ද රචනා කිරීම.

- සිංහල භාෂාවෙන් - සිදත් සඟරාව, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, යෝගාර්ණවය, කව්සිළුමිණ / පාලි භාෂාවෙන් - හත්ථවනගල්ල විහාරවංසය, සමන්තකූට වර්ණනාව, පයෝග සිද්ධි, භේසජ්ජමඤ්ජුසාව, රසවාහිණිය, ජින චරිත / සංස්කෘත භාෂාවෙන් - දෛවඥකාමධෙනුව.

**(ලකුණු 14 යි)**

**6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බලය බිඳවැටීමට තුඩුදුන් සාධක විවේචනාත්මකව විමසන්න.**

❖ 16 වන සියවස මුල කෝට්ටේ රාජධානි සමයේදී මෙරටට පැමිණි පෘතුගීසීන්, 1521 න් පසුව මෙරට දේශපාලනයට මැදිහත්වීමට පටන්ගන්නා අතර 16 වන සියවස අවසන් වනවිට කෝට්ටේ රාජධානියට අයත්ව තිබූ දිවයිනේ වෙරළබඩ කලාපයේ ස්වකීය බලය පැතිරවීමට සමත් වීම.

❖ ඉක්බිතිව ඔවුන්ගේ ඉලක්කය වූයේ උඩරට අත්පත් කරගැනීම වුවත් 17 වන සියවස මුල් අර්ධයේ බලයට පත් උඩරට රජවරුන් එම ඉලක්කය සපුරාගැනීමට බාධා පැමිණ වූ අතර ලන්දේසීන්ගේ ආධාරද ඇතිව 1658 වනවිට දිවයිනෙන් පෘතුගීසීන් පළවා හැරීම.

❖ මේ ආකාරයට පෘතුගීසි බලය බිඳවැටීම පසුබිමෙහි පැවති සාධක ගණනාවක් හඳුනාගත හැකිවීම:
  - උඩරට පාලකයන්ගේ පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තිය - පළමුවන විමලධර්මසූරිය රජු (දන්තුරේ, බලන සටන්), සෙනරත් රජු (ගන්නොරුව සටන) හා විශේෂයෙන්ම දෙවන රාජසිංහ රජු (රන්දෙණිවෙල සටන).
  - පෘතුගීසීන් ගෙනගිය මර්දනකාරී පාලන පිළිවෙත (මිෂනාරි කටයුතු සඳහා අනුබලදීම, ස්වදේශීය ශ්‍රමය සූරාකෑම, අධික බදු, බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය ආදිය) හේතුකොටගෙන ජනතාව තුළ පැවති පෘතුගීසි විරෝධය.
  - යටත්විජිත අත්පත් කරගැනීම සඳහා පෘතුගීසීන් හා ලන්දේසීන් අතර පැවති තරඟය - මේ හේතුකොටගෙන පෘතුගීසීන් පළවාහැරීමේ ප්‍රයත්න සඳහා ලන්දේසී ආධාර ලබාගැනීමට උඩරට පාලකයන් සමත්වීම.
  - ලන්දේසි නාවික බලය පෘතුගීසි නාවික බලය අභිබවා යාම.
  - ලන්දේසීන් උපක්‍රමශීලී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම (1638 වෙස්ටර්වෝල්ඩ් ගිවිසුම අත්සන් තැබීම).

**(ලකුණු 14 යි)**

**7. "බ්‍රිතාන්‍යයන් යටතේ වතුවගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයෙහි මූලික පරිවර්තනයක් ඇති කළේය."**

**(i) ශ්‍රී ලංකාවේ පළමුවරට කෝපි වත්තක් ආරම්භ කළ වැවිලිකරුවා නම් කරන්න.**

ජෝර්ජ් බර්ඩ්

**(ලකුණු 01 යි)**

**(ii) දහනවවන සියවසේ දී වගා කරන ලද ප්‍රධාන වාණිජ භෝග <u>දෙකක්</u> නම් කරන්න.**

කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර්, පොල්

**(ලකුණු 02 යි)**

**(iii) වතුවගාවේ ආරම්භයට උපකාරී වූ කෝල්බෲක් කොමිසමේ ප්‍රතිසංස්කරණ යෝජනා සැකෙවින් දක්වන්න.**

❖ ඒ වනවිට සුළු පරිමාණයෙන් සිදුවුණු කෝපි වගාව වාණිජ බෝගයක් ලෙස මහා පරිමාණයෙන් වගා කිරීමෙහිලා අත්‍යවශ්‍ය සාධක වන භූමිය, ශ්‍රමය හා ආයෝජනය යන අංශ වර්ධනය කිරීමට කොමිසමේ යෝජනා සමත්වීම.
- භූමිය - ඉඩම් මිලදී ගැනීමේදී එතෙක් පනවා තිබූ සීමා ඉවත් කිරීම.
- ශ්‍රමය - රාජකාරිය අහෝසි කිරීම මගින් ස්වදේශික ශ්‍රමය සපයා ගැනීම අපේක්ෂා කළ අතර, අපේක්ෂා කරන ලද මට්ටමෙන් නොවුණත් කිසියම් ප්‍රමාණයකට වතු හා වතු ආශ්‍රිත රැකියා කෙරෙහි ස්වදේශිකයන් යොමුවීම.
- ආයෝජනය - ඉහත සාධක දෙක මෙන්ම ආණ්ඩුකාරයා සතුව පැවති අසීමිත බලතල සීමා කිරීම ආදී වූ පියවර මගින්ද ආයෝජකයන්ට හිතකර වාතාවරණයක් නිර්මාණය කිරීමට උත්සාහ කිරීම.

❖ සිවිල් සේවකයන්ගේ විවිධ දීමනා කපාහැරීමෙන් පසුව පෞද්ගලික ව්‍යාපාරවල නිරතවීමට ඔවුන්ට අවසර ලබාදීම මගින් එකී සේවකයන් වඩාත් වතු වගාවට යොමු වීම. එහි අතුරුඵලයක් ලෙස සිවිල් සේවයේ උපරිම අවධානය වතු අංශයේ අභිවෘද්ධිය සඳහා යොමුවීම.

❖ බැංකු ක්‍රමය හා මූල්‍ය ආයතන පිහිටුවීම මගින් වාණිජ බෝග වගාවට වක්‍ර ලෙස අනුබලදීම.

**(ලකුණු 04 යි)**

**(iv) දහනවවන සියවසේ වතුවගාවේ ව්‍යාප්තිය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ මූලික පරිවර්තනයක් සිදු වූ අයුරු පරීක්ෂා කරන්න.**

❖ රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය අහෝසි වී රාජ්‍ය නිර්බාධවාදී ආර්ථිකයක් දියුණුවීම.
❖ බහු වැවිලි කර්මාන්තයේ ආරම්භය සිදුවීම.
❖ වතු අංශයේ වර්ධනය මෙන්ම එම අංශයේ වැඩිදියුණු කිරීම් උදෙසා සංවිධාන බිහිවීම දක්නට ලැබීම (උදා: වැවිලිකරුවන්ගේ සංගමය).
❖ දේශීය කෘෂිකර්මාන්තය, ගෘහ කර්මාන්ත ආදිය කෙරෙහි අවධානය හීනවීම.
❖ මුදල් භාවිතය, බැංකු කටයුතු හා මූල්‍ය ආයතන වර්ධනය වීම.
❖ යුරෝපා ආයෝජකයන් මෙන්ම දකුණු ඉන්දීය ශ්‍රමිකයන්ගේ ආගමනය සිදුවීම.
❖ ස්වදේශිකයන් සීමිත මට්ටමෙන් වතු අංශයේ (පොල් වතු) ආයෝජනය කිරීම.
❖ ස්වදේශිකයන් වතු ආශ්‍රිත රැකියා හා සේවා සැපයීමේ නිරත වීම.
❖ මහාමාර්ග හා දුම්රියමාර්ග පද්ධතිය වර්ධනය වීම.
❖ ආර්ථිකයේ ප්‍රධාන අංශය බවට වතුවගාව පත්වීම හා එහි නිෂ්පාදන ක්‍රියාවලියට ලෝක වෙළඳපළ තත්ත්වයන් සෘජුවම බලපෑම.

**(ලකුණු 07 යි)**

**8. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.**

පැවති ආණ්ඩු ක්‍රමයේ, එනම්, 1924 මැනිං-ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ අඩුපාඩු පරීක්ෂා කොට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඩොනමෝර් කොමිෂන් සභාව 1927 දී මෙරටට පත්කොට එවනු ලැබීය. එම කොමිසම විසින් යෝජනා කොට පසුව ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ වශයෙන් පහත සඳහන් කරුණු ගෙනහැර දක්වා තිබීම වැදගත් වේ.

## 1. සර්වජන ඡන්ද බලය

- ❖ මෙතෙක් ඡන්ද බලය හිමිවුණේ මුළු ජනගහණයෙන් 4% කට පමණි. කොමිසම මගින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට කළ යෝජනාවට ඒ. ඊ. ගුණසිංහ හැරුණු විට සෙසු ජාතික නායකයන් සියලු දෙනාම පාහේ විරුද්ධ වුවත් එය සම්මත විය. සර්වජන ඡන්ද බලය හිමි යුරෝපා නොවන ජනතාවක සිටි පළමු බ්‍රිතාන්‍ය යටත්විජිතය බවට ලංකාව පත්වීම.
- ❖ මෙමගින් ජාතිමූල නියෝජනය අහෝසි කිරීම.
- ❖ වයස අවුරුදු 21 ට ඉහළ සෑම කෙනෙකුටම ඡන්ද බලය හිමිවීම. මුලදී ස්ත්‍රීන්ට වයස අවුරුදු 30 ත් පුරුෂයින්ට වයස අවුරුදු 21 ත් ලෙස තීරණය කර තිබුණත්, පසුව වයස අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාට ඡන්ද බලය හිමිවීම.

## 2. ආණ්ඩුකාරයා

- ❖ ආණ්ඩුකරු සතු බලතල සීමා සහිත වීම. තමා ගනු ලබන තීන්දු තීරණ සෑමවිටම යටත් විජිත භාර මහලේකම්ට වාර්තා කළ යුතු වීම.
- ❖ ආණ්ඩුකාරයාගේ වගකීම වූයේ ව්‍යවස්ථාදායකය හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ඉක්මන් හෝ අපරික්ෂාකාරී ක්‍රියා වැළැක්වීමයි.
- ❖ අණ්ඩුකාරයා සතු බලතලː
  - ▪ රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇමතීමේ බලය
  - ▪ රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරනු ලබන පනත් සම්බන්ධයෙන් කිහිපාකාරයකින් ක්‍රියා කිරීමට තිබූ බලතල
    - ✓ එක එල්ලේම එකඟවීම
    - ✓ මහරජතුමාගේ අනුමැතිය ලැබෙන තෙක් ඊට එකඟ නොවීම
    - ✓ සංශෝධන සහිතව හෝ රහිතව හෝ රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත යළිත් සලකා බැලීම සඳහා යොමු කිරීම.
    - ✓ වැදගත් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් අඩංගු පනතක් නම් එය සහතික කොට, පසුව නීතිගත කිරීම සඳහා මන්ත්‍රණ සභාවේ 2/3 ක ඡන්දය ඉල්ලා සිටීම.
    - ✓ එකඟ වුවත් එය ක්‍රියාවේ යෙදවීම හයමසකට කල්තැබීම
    - ✓ මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම
  - ▪ හදිසි අවස්ථාවකදී හෝ එබඳු අවස්ථාවක් පැනනැගී ඇතැයි හැඟෙන විට ඕනෑම දෙපාර්තමේන්තුවක පාලනය සියතට ගැනීම.
  - ▪ රාජ්‍ය සේවාවේ සේවකයින් පත්කිරීම, මාරු කිරීම, අස්කිරීම හා ඔවුන් සම්බන්ධ විනයානුකුල ක්‍රියාමාර්ග ගැනීම.

## 3. රාජ්‍ය මන්ත්‍රණ සභාව

- ❖ මෙතෙක් පැවති ව්‍යවස්ථාදායක හා විධායක සභා වෙනුවට ඇතිකළ රාජ්‍ය මන්ත්‍රණ සභාව සාමාජිකයන් 61 දෙනෙකුගෙන් සමන්විත වීම.
- ❖ ප්‍රදේශමූල ඡන්දයෙන් පත්කළ 50 ක් සුළු ජාතික නියෝජනය සඳහා නාමකරණයෙන් පත්කළ 8 ක් මෙන්ම නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් සංයුක්ත වීම.
- ❖ බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු සිදු වූ ආකාරයට මෙහ කටයුතුද සිදුවිය.
- ❖ මන්ත්‍රණ සභාව සතු විධායක බලය ක්‍රියාත්මක වූයේ විධායක කාරක සභා මගිනි.

**4. විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය**

❖ විධායක කාරක සභා 7 ක් පිහිටුවීය. ඒවා නම්,

1. ස්වදේශීය කටයුතු
2. කෘෂිකර්මය
3. පළාත් පාලනය
4. සෞඛ්‍යය
5. කම්කරු කර්මාන්ත හා වෙළඳ කටයුතු
6. අධ්‍යාපනය
7. සන්නිවේදනය, ගමනාගමනය හා ප්‍රසිද්ධ වැඩ

❖ විධායක කාරක සභාවක සාමාජික සංඛ්‍යාව අටකට නොවැඩි හතකට නොඅඩු වීම.

❖ අමාත්‍ය මණ්ඩලය සකස් වී තිබුණේ මෙම විධායක කාරක සභා හතේ ප්‍රධානීන්ගෙන් සහ නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙනි.

**(ලකුණු 14 යි)**

**(B) 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස් වූ ආකාරය පරීක්ෂා කරන්න.**

| 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
|---|---|
| ❖ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් රැස්වී මහජන අදහස් සඳහා අවස්ථාවක්ද ලබාදී සම්පාදනය කිරීම. | ❖ පාර්ලිමේන්තු පටිපාටිය තුළින් සම්පාදනය කිරීම. |
| ❖ ව්‍යවස්ථාදායක සභාව ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම. | ❖ එය නැවතත් පාර්ලිමේන්තුව ලෙස හැඳින්වීම. |
| ❖ 1948 සිට අග්‍රාණ්ඩුකාරයා නම් වූ නාමික විධායක ධුරය ජනාධිපතිවරයා බවට පත් කිරීම. ජනාධිපති පත් කිරීම එංගලන්ත කිරීටයෙන් නොව මහජන ඡන්දයෙන් පත් වූ අගමැතිවරයා විසින් සිදු කිරීම. | ❖ නාමික විධායකයක් නොමැති අතර නියම විධායක බලය මහජන ඡන්දයෙන් පත් වන ජනාධිපතිවරයා සතුවීම. |
| ❖ නියම විධායකය වූ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයාය. | ❖ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විධායක ජනාධිපතිවරයා වීම. |
| ❖ 1948 සිට ක්‍රියාත්මක වූ ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම අහෝසි කොට ඒ බලතල කැබිනට් මණ්ඩලයට පැවරීම. | ❖ 1948 පිහිටවූ ඒවාට වඩා සීමා සහිතව වුවත් එකී ස්වාධීන කොමිසන් සභා නැවත පිහිටුවීම. |
| ❖ මැතිවරණ ක්‍රමය වශයෙන් ඒ ඒ කොට්ඨාශයයෙන් වැඩිම ඡන්ද ලබාගන්නා පුද්ගලයා ව්‍යවස්ථාදායකයට තෝරාගැනීමේ ක්‍රමය. | ❖ සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම. |

| | |
|---|---|
| ❖ බුදු දහම ආරක්ෂාකොට පවත්වාගෙන යාම හා අන්‍ය ආගම් නිදහසේ ඇදහීමට පූර්ණ ආරක්ෂාව ලබාදෙන බව තහවුරු කිරීම.<br><br>❖ 1956 දී නීතියක් වශයෙන් ගෙන එන ලද සිංහල රාජ්‍ය භාෂාව ලෙස සැලකීම, මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීම. | ❖ එම ප්‍රතිපාදනය එලෙසම පැවතීම.<br><br>❖ දෙමළ භාෂාවට නිසි සැලකිලි නොලැබුණු බවට එතෙක් පැවති චෝදනාවට ප්‍රතිචාර වශයෙන් දෙමළ භාෂාව 'ජාතික භාෂාවක්' වශයෙන් පිළිගැනීම.<br><br>❖ ජනාධිපතිවරයාට අවශ්‍ය නීතියක් පාර්ලිමේන්තුව මගින් සම්මත කරවා ගත නොහැකි වූ අවස්ථාවක එය මහජන මතය සඳහා ඉදිරිපත් කිරීමේ ජනමතවිචාරණ ක්‍රමය මෙම ව්‍යවස්ථාව විසින් හඳුන්වා දෙන ලද නවාංගයකි. |

**(ලකුණු 14 යි)**

**9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) සීගිරිය**

- ❖ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් බ්‍රාහ්මී සෙල්ලිපිවලට අනුව සීගිරිය භික්ෂු වාසස්ථානයක් ලෙස පැවත තිබීම.
- ❖ මහාවංසයට අනුව ක්‍රි.ව. 5 වන සියවසදී කාශ්‍යප රජු, තම සොහොයුරු මුගලන්ගෙන් ආරක්ෂා වීම සඳහා සීගිරිය ගොඩනංවා "කුවේරයා ආලකමන්දාවේ විසූ ආකාරයට" සමාන ආකාරයෙන් වාසය කළ බව වාර්තා වීම.
- ❖ මෙය ආරක්ෂක මධ්‍යස්ථානයක් බව එහි ඇති දිය අගල්, ප්‍රාකාර, ආරක්ෂිත මාළිගා ආදියෙන් තහවුරු වේ.
- ❖ එහෙත් ඊට අමතරව අලංකාර උද්‍යාන, පොකුණු හා ජලමල් ආදියෙන් සමලංකෘතව නිර්මාණය කොට තිබීම.
- ❖ මෙහි දක්නට ලැබෙන විශිෂ්ටතම අංගයක් ලෙස බිතු සිතුවම් සලකනු ලැබීම.
- ❖ සීගිරිය නැරඹීමට අතීතයේදී පැමිණි දෙස් විදෙස් ජනයා අතරින් ඇතැමෙක් විසින් ලියන ලද කුරුටු ගී අඩංගු කැටපත් පවුරද ඉමහත් වැදගත්කමක් ඉසිලීම.
- ❖ විදේශ සබඳතා පිළිබඳ වැදගත් සාධකයක් ලෙස සීගිරියෙන් හමුවූ කාසි සැලකිය හැකිවීම.
- ❖ කාශ්‍යප රජුගෙන් පසු අවධියේ සීගිරිය රාජකීය මධ්‍යස්ථානයක් නොවූ අතර එහි බෞද්ධ ආරාම පිහිටුවා ධර්මරුචි නිකායේ භික්ෂූණ්ට පූජා කළ බව වාර්තා වීම.
- ❖ පසුකාලීනව වල්බිහිවූ සීගිරිය බ්‍රිතාන්‍ය පාලන අවධියේදී නැවත සොයාගනු ලැබීම.

**(ලකුණු 07 යි)**

**(ii) නිශ්ශංකමල්ල රජතුමා**

- ❖ මහා පරාක්‍රමබාහු රජුගෙන් පසුව පොළොන්නරුවේ බලයට පත් වැදගත් පාලකයෙකු වශයෙන් නිශ්ශංකමල්ල රජු සලකනු ලැබීම.
- ❖ කාලිංග පෙළපතට අයත් නිශ්ශංකමල්ල රජු පිළිබඳ තොරතුරු ගල්පොත සෙල්ලිපිය, දොරටියාව සන්නස, වදුරුප්පේ ලිපිය, දඹුලු ගිරිලිපිය, රාජාවලිය හා මහාවංසය ආදී මූලාශ්‍රයවල අන්තර්ගතවීම.
- ❖ සෙල්ලිපි වැඩිම සංඛ්‍යාවක් පිහිටවූ පාලකයෙකු ලෙස මේ රජු ප්‍රකට වීම.
- ❖ අභියෝග රැසකට මුහුණදීම:
  - ඉන්දියාවේ කාලිංග දේශයේ උපත ලද්දෙකු වූ බැවින් නිශ්ශංකමල්ලගේ විදේශික සම්භවය.
  - පළමුවන පරාක්‍රමබාහු රජුගේ දැවැන්ත පෞරුෂය, ඔහුගේ විශිෂ්ඨ සේවාව හා කීර්තිය.
  - ගොවි කුල ජනයාගේ (ප්‍රදේශාධිපතියන්ගේ) විරෝධය.
  - සේනාධිපතිවරුන්ගේ විරෝධය.
  - කාලිංග විරෝධී පාණ්ඩ්‍ය වංශික බලවේග.
  - ප්‍රත්‍යන්ත ප්‍රදේශවල වැසියන්ගේ විරෝධතා.

**❖ ඒවා ජයගත් අන්දම:**

- කාලිංග වංශිකයන්ට මෙරට රාජ්‍ය උරුමයක් ඇති බව තහවුරු කිරීමට උත්සාහ ගැනීම හා කාලිංගයේ ඇති වැදගත්කම නිරතුරුව සිහිපත් කරවීම.
- පළමුවන පරාක්‍රමබාහු රජු තම වංශයෙහි පැවැත්ම උදෙසා සිංහපුරයට හසුන්පත් යවා තමා ගෙන්වා ගත් බව ප්‍රකාශ කිරීම.
- පරාක්‍රමබාහු රජුට කීර්තිය ලබාදුන් දෑ තමන්ද කළ බව ප්‍රකාශ කිරීම හා පරාක්‍රමබාහු රජු අනුකරණය කිරීම.
- පරාක්‍රමබාහුගේ කාර්යසිද්ධීන් අවතක්සේරු කොට ඒ වෙනුවට තමන්ගේ ශ්‍රේෂ්ඨත්වය කියාපෑම.
- ගොවි කුල ජනයාට නිග්‍රහ කිරීම හා තර්ජනය කිරීම.
- සංචාර මගින් ප්‍රත්‍යන්ත ප්‍රදේශවල විරෝධතා මැඩපැවැත්වීමට සමත්වීම සහ රටවැසියන්ගේ පක්ෂපාතිත්වය දිනාගැනීමට උත්සාහ දැරීම. උදා: සහනශීලී බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම (කැති අඩ, පිසඹුරුවත ආදී බදු අහෝසි කිරීම).
- බුද්ධාගමට අනුග්‍රහ දැක්වීම.
- පරාක්‍රමබාහු රජු විසින් ගොඩනගන ලද පරිපාලන තන්ත්‍රය නිසි ලෙස හසුරුවාගෙන වසර නවයක් රට තුළ දේශපාලන එක්සත්භාවය හා ස්ථාවරත්වය පවත්වාගෙන යාමට සමත්වීම.

**❖ සංස්කෘතික සේවය:**

- භින්නව පැවති තුන් නිකායන් සමගි කිරීම හා සසුන ආරක්ෂා කිරීම පිණිස භික්ෂූණ්ට අවවාද කිරීම.
- විවිධ ප්‍රදේශවල සිද්ධස්ථාන පිළිසකර කරවීම (අනුරාධපුර, මහාගාම, මැඩිලිගිරිය, වැලිගම්වෙහෙර, දඹුල්ල)
- සිද්ධස්ථාන රැසක් ඉදිකරවීම (රන්කොත් වෙහෙර, වටදාගෙය, හැටදාගෙය, නිශ්ශංක ලතා මණ්ඩපය, සංඝාරාම විහාරය).
- විවිධ ස්ථානවල දාන ශස්ත්‍ර හා බ්‍රහ්ම ශස්ත්‍ර පිහිටුවීම.
- තුලාභාර දීම.

**(ලකුණු 07 යි)**

**(iii) ආර්යචක්‍රවර්ති පෙළපත**

- ❖ ආර්යචක්‍රවර්තීන් පිළිබඳ තොරතුරු ***යාල්පානවෛපවමාලෛ*** සහ ***ශෙගරාශසේගරමාලෛ*** යන මූලාශ්‍රයවල අන්තර්ගත වීම.
- ❖ 1344 දී දිවයිනට පැමිණි ඉබන් බතුතා ආර්යචක්‍රවර්තීන් 'ලංකාවේ සුල්තාන්' ලෙස හඳුන්වා තිබීම.
- ❖ යාපන රාජධානියේ ඉතිහාසයේ ආර්යචක්‍රවර්ති පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ තොරතුරු හමුවේ.

1. ශිංගෛ ආරියණ් (චිංකෛයාරියර්) නමින් ප්‍රකට වූ විජය කුලංගෛ පළමු ආර්යචක්‍රවර්ති පාලකයා වීම. 14 වන සියවසේදී යාපනය කේන්ද්‍ර කොටගෙන රාජධානියක් පිහිට වූ මොහු නල්ලූර් කන්දස්වාමි කෝවිල ඇතුළු කෝවිල් කිහිපයක් කරවීම.

2. කුලශේකර ශිංගෛ ආරියණ්, කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධියට වැඩි අවධානයක් යොමු කිරීම.
3. වික්කිරම ශිංගෛ ආරියණ්, දෙමළ-සිංහල වැසියන් අතර සාමයක් ඇතිකිරීමට සමත්වීම.
4. වරෝදය ශිංගෛ ආරියණ්ද සිංහල-දෙමළ සමගිය වර්ධනය කිරීමට සමත්වීම.
5. මාර්තාණ්ඩ ශිංගෛ ආරියණ් අධ්‍යාපනය හා කෘෂිකර්මාන්තය දියුණු කළ අතර වන්නියාර්වරුන්ගේ බලය සීමාකිරීමටද සමත් වීම.
6. කුණපූෂණ ශිංගෛ ආරියණ්ගේ සමයේ යාපන රාජධානියේ සමෘද්ධිමත්ව පැවතීම.
7. විරෝදය ශිංගෛ ආරියණ් වන්නියාර්වරුන්ගේ මෙහෙයවීමෙන් සිංහල වැසියන් ඇතිකළ කැරැල්ල මර්දනය කිරීම.
8. ජයවීර (චෙයවීර) ශිංගෛ ආරියණ් මුතුපර සම්බන්ධයෙන් භුවනෙකබාහු රජු සමග ඇතිකරගත් සටනින් ජයගෙන වසර 12 ක් තිස්සේ ස්වකීය ආධිපත්‍යය දිවයිනේ පැතිරවීමට සමත් වීම.
9. කුණවීර ශිංගෛ ආරියණ් දිවයිනේ දකුණේ ප්‍රදේශ කිහිපයකට පහරදී එම ප්‍රදේශවල දෙමළ ජනයා පදිංචි කරවීමට සමත්වීම.
10. කනගශූරිය (කණකශූරිය) ශිංගෛ ආරියණ් වන්නියාර්වරුන්ගේ මෙහෙයවීමෙන් ඇති වූ සිංහලයන්ගේ කැරැල්ලට මුහුණදීමට අපොහොසත්ව ඉන්දියාවට පළාගිය නමුත් වසර 17 කට පසුව පෙරළා පැමිණ රාජ්‍යය භාරගැනීම.
11. පරාජශේකරණ්ගේ සමයේ සාහිත්‍ය ප්‍රබෝධයක් පැවතීම. ඔහුගේ සහෝදරයකු යාපනේ දෙමළ ශාස්ත්‍රාලයක් පිහිටුවා දකුණු ඉන්දියාවෙන් දෙමළ පොත් විශාල සංඛ්‍යාවක් ගෙන්වීම හා ග්‍රන්ථකරණයේ නිරතවීම; ඔහුගේ බෑණා වූ අරිශකේශරී සංස්කෘත ***රඝුවංශය*** දෙමළට පරිවර්තනය කිරීම.
12. සංකිලි 1519 දී පරරාජශේකරණ් මරා රජවීම. මේ අවධියේදී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කිරීම. අභ්‍යන්තර අර්බුද හේතුකොටගෙන 1566 දී මොහුට රාජ්‍යය අහිමිවීම.

- ❖ තෙවන වික්‍රමබාහු රජ දවස ගම්පොළ රාජධානියට පහරදී එහි ඇතැම් ප්‍රදේශවලින් බදු අයකර ගැනීමට තරම් මෙම පාලකයන් ඇතැම් අවස්ථාවල ශක්තිමත් වීම.
- ❖ සයවන පරාක්‍රමබාහු රජු සපුමල් කුමරු යවා ආර්යචක්‍රවර්තීන් පරාජය කිරීමට සමත්වීම.

**(ලකුණු 07 යි)**

**(iv) 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය**

❖ මෙම සටනේ අරමුණ වූයේ ඉංග්‍රීසීන් පළවාහැරීම වූ බැවින් මෙම සටන ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහිව දියත් කළ පළමු නිදහස් අරගලය වශයෙන් වර්තමානයේ පිළිගැනීම.

**හේතු:**

❖ 1815 උඩරට ගිවිසුමේ වගන්ති බ්‍රිතාන්‍යයන් විසින් කඩකිරීම හේතුකොටගෙන උඩරට භික්ෂූන්, රදළයන් හා මහජනතාව තුළ පැවති කලකිරීම:

- 5 වන වගන්තියෙන් බුද්ධාගම ආරක්ෂා කොට පවත්වාගෙන යන බවට පොරොන්දු වුවත් කිතුනුවන් වූ බ්‍රිතාන්‍යයන් එය ඉටුකිරීමට අසමත්වීම.
- 4 වන වගන්තියෙන් දේශීය පරිපාලන ක්‍රමය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට පොරොන්දු වූ නමුත් උඩරට අලිඛිත සාම්ප්‍රදායික නීති පිළිබඳව අවබෝධයක් හෝ පිළිගැනීමක් බ්‍රිතාන්‍යයන් තුළ නොපැවතීම. උදා: හජ්ජි මරික්කාර් මඩිගෙ බද්දේ මුහන්දිරම් තනතුරට පත්කිරීම.
- දුර රටක සිටින රජ කෙනෙකු තම පාලකයා වශයෙන් පිළිගැනීමට සිදුවීම, රදළයන්ට හා භික්ෂූණ්ට සාම්ප්‍රදායිකව හිමිව තිබූ ගරු සත්කාර කෙරෙහි බ්‍රිතාන්‍ය නිලධාරීන් සැලකිල්ලක් නොදක්වීම ආදිය සාමාන්‍ය ජනතාව තුළ කලකිරීමක් ඇති කිරීම.

❖ ආසන්නම හේතුව, හජ්ජි මරික්කාර්ගේ පත්කිරීම හා ඔහුගේ ක්‍රියාකලාපය නිසා ඌව-වෙල්ලස්ස ප්‍රදේශයේ නොසන්සුන් වාතාවරණයක් ඇතිවෙමින් තිබියදී නායක්කර් පෙළපතෙන් පැවත එන්නෙකු වන දොරේසාමි බව කියාගත් පුද්ගලයෙකු භික්ෂූණ් වහන්සේගේද ආශිර්වාද ඇතිව පෙරට පැමිණීම. කැප්පටිපොළ දිසාව වැනි ප්‍රබල රදළ ප්‍රධානීන් සටන්කාමීන්ට එක්වීම හේතුකොටගෙන මෙම සටන බ්‍රිතාන්‍ය පාලනයට දැඩි තර්ජනයක් එල්ල කිරීමට සමත්වීම.

❖ මේ හේතුව නිසාම බ්‍රිතාන්‍ය පාලකයන් අතිරේක හමුදා ආධාරද ලබාගෙන මෙම ජනතා නැගී සිටීම දරුණු ලෙස මර්දනය කිරීම.

❖ සටන පරාජය වීමට සටන්කරුවන් අතර සංවිධානය දුර්වල වීම, නායකත්වය අතර හටගත් මතභේද, මොල්ලිගොඩ වැනි ඇතැම් ප්‍රධාන රදළවරුන්ගේ සහාය බ්‍රිතාන්‍යයන්ට හිමිවීම ආදී කරුණු ගණනාවක් හේතුවීම.

**ප්‍රතිඵල**

❖ 1815 ගිවිසුමෙන් හිමිව තිබූ සීමිත නිදහසටද බාධා පමුණුවමින් 1818 නොවැම්බර් 21 ප්‍රකාශනය පැනවීම.

❖ නව අධිකරණ ප්‍රඥප්තියක් හඳුන්වාදීම.

❖ උඩරට පළාත් තවදුරටත් වෙනම පාලන ඒකකයක් ලෙස පවත්වාගෙන යමින් ආණ්ඩුකාරයා යටතේ එම ප්‍රදේශ පාලනය කොමසාරිස් මණ්ඩලය යටතේම තවදුරටත් පවත්වාගෙන යාම.

❖ කැප්පෙටිපොළ, මඩුගල්ලේ වැනි නායකයන්ට මරණ දඬුවම නියම වූ අතර තවත් පිරිසක් මුරුසියට පිටුවහල් කිරීම.

❖ සාමාන්‍ය ජනයා විශාල ප්‍රමාණයක් සටනේදී මියයාම.

❖ සටන්කාමීන් මර්දනය සඳහා යටත්විජිත ආණ්ඩුව අනුගමනය කළ බිම්පාළු ප්‍රතිපත්තිය හේතුකොටගෙන ඌව-වෙල්ලස්ස ප්‍රදේශ විශාල වශයෙන් විනාශ වූ අතර එහි අහිතකර ප්‍රතිඵල අද දක්වාම දක්නට ලැබීම.

**(ලකුණු 07 යි)**

## (v) ගොවි ජනපද ව්‍යාපාරය

- ❖ ප්‍රතිසංස්කරණය කරන ලද මහ වැව් ජලයෙන් අලුතෙන් අස්වද්දන ලද ඉඩම්වල වෙනත් ප්‍රදේශවලින් ගොවීන් ගෙන්වා පදිංචි කරවීම මූලික වශයෙන් ගොවිජනපද ව්‍යාපාරය මගින් සිදුවීම.
- ❖ වර්තමානයේ පවත්නා ගොවි ජනපද ව්‍යාපරය ආරම්භ වූයේ 1933 මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයෙනි. ඩී. එස්. සේනානායක මහතා මෙහිලා පුරෝගාමී විය.
- ❖ 1933 දීම කලා වැව (කගම) සහ නාච්චදූව වැව ආශ්‍රිතවද ගොවි ජනපද ආරම්භ වීම.
- ❖ ගොවි ජනපද පිහිටුවීමේ මූලික අරමුණු කීපයකි:
    - ▪ අධික ජනගහණයකින් යුතු ප්‍රදේශවල සිට ජනයා සාපේක්ෂව අඩු ජනගහණයක් සිටි ප්‍රදේශවල පදිංචි කරවීම.
    - ▪ ඒ සඳහා ඉඩම් අහිමි ගොවීන් තෝරාගෙන ඔවුන්ට කෘෂිකර්මාන්තයේ නිරත වීමට අවස්ථාව සලසාදීම.
    - ▪ දිවයිනේ වී අස්වැන්න ඉහළ දැමීම මගින් සහල් ආනයනයට යන වියදම අවම කිරීම.
- ❖ කලා වැව සහ නාච්චදූව ව්‍යාපාරවල ගොවීන් පදිංචි කරවීමේදී ඉස්රායලය, ලිබියාව හා ඉන්දියාව වැනි රටවල අත්දැකීම්ද උපයෝගී කර ගැනීම.
    - ▪ ගොවීන්ට නිවසක් ඉදිකිරීමට මූල්‍යාධාර රජය විසින් ලබාදීම. 1939 න් පසුව ගොවීන් පදිංචි කරවන අවස්ථාව වනවිට නිවාස ඉදිකොට තැබීම සිදුවිය.
    - ▪ ආරම්භයේදී මඩින් අක්කර පහක්ද ගොඩින් අක්කර තුනක්ද එක පවුලකට ලබාදෙන ලදී.
    - ▪ රජයේ වියදමින් ඉඩම් වගාවට සුදුසු පරිදි සකස් කර දීම හා වගාවට අවශ්‍ය වෙනත් සේවා සපයන ලද අතර මුල් අස්වැන්න ලැබෙන තුරු යැපීම් දීමනාවක් ලබාදීම.
    - ▪ මෙලෙස ලබාදුන් ඉඩම් අන්සතු කළ නොහැකි වීම.
    - ▪ ජනපදවලට අවශ්‍ය යටිතල පහසුකම් රජය මගින් සපයා දීම (මාර්ග, පාසල්, රෝහල්, තැපැල් හල් හා සමුපකාර සමිති ආදිය).
- ❖ මින්නේරියෙන් ආරම්භ වූ ගොවි ජනපද ව්‍යාපාරය වියළි කලාපයේ සෙසු ප්‍රදේශවලද ක්‍රමයෙන් ව්‍යාප්ත කෙරිණ.
- ❖ නිදහස ලබන අවධිය වනවිට මින්නේරිය, නාච්චදූව, කලාවැව (කගම), ඉරණමඩු, මිණිපේ, බෙරගම, පරාක්‍රම සමුද්‍රය, රිදීබැඳිඇල, ඇලහැර ආදී ජනපද පිහිටුවා තිබිණි.
- ❖ නිදහසෙන් පසු බලයට පත් වූ සෑම රජයක්ම නව ජනපද පිහිටුවීම සිදුකොට ඇත (හුරුළු වැව, දේවහුව, ගල් ඔය).

**(ලකුණු 07 යි)**

## (vi) 1956 මහා මැතිවරණය

- ❖ 1956 අප්‍රේල් 5, 7 සහ 10 යන දිනවල මහා මැතිවරණය පැවැත්වීම.
- ❖ මැතිවරණ ව්‍යාපාරයේ කැපී පෙනෙන සිදුවීම් ගණනාවකි:
    - ▪ සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගැනීම.
    - ▪ 1947 සිට අඛණ්ඩව බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති විවේචනය කිරීම හා ඒවායේ වෙනසක් අවශ්‍ය බව අවධාරණය කිරීම.
    - ▪ භික්ෂූන් වහන්සේ විසින් පිහිටුවනු ලැබූ බුද්ධ ශාසන කොමිසම විසින් බුද්ධාගම සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් ඉටුවිය යුතු වගකීම් අවධාරණය කරනු ලැබීම.
    - ▪ සමාජයේ විවිධ අංශ මුහුණ දී සිටි අර්බුද හමුවේ සඟ-වෙද-ගුරු-ගොවි-කම්කරු යන අංශ නියෝජනය වන පංචමහා බලවේගය සංවිධානය වීම.

- මේ සියලු බලවේග යටත්විජිත ශේෂයන් සහිත ආණ්ඩුක්‍රමය වෙනුවට දේශීයත්වය ගරුකරන නව ආණ්ඩුක්‍රමයක් ලබාගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාකාරී වීම.
- මේ ව්‍යාපාරය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා ඒකරාශී වීම.
- වාමාංශික පක්ෂ වැනි විවිධ කණ්ඩායම් එම පක්ෂය සමග සම්බන්ධ වී මහජන එක්සත් පෙරමුණ නම් සන්ධානය පිහිටුවාගෙන ඒ යටතේ මැතිවරණයට ඉදිරිපත් වීම.

❖ එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය ආසන 8කට පමණක් සීමා කොට මහජන එක්සත් පෙරමුණ කැපී පෙනෙන ජයග්‍රහණයක් ලැබීම.

❖ මෙම මැතිවරණ ව්‍යාපාරය මෙන්ම මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණයද මෙරට දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කිරීම.

- දේශපාලන බලය එක් පක්ෂයකින් තවත් පක්ෂයකට මාරුවීම.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජනය වූ කොටස් හා එහි කටයුතු වෙනස් වීම:
    - ✓ සිංහල ජාතිකවාදීන්, බෞද්ධයන් හා මාක්ස්වාදීන් වශයෙන් ඒ තුළ මෙතෙක් වෙන්ව සිටි කණ්ඩායම් එක පෙරමුණක් වීම.
    - ✓ ජාතික ඇඳුම / සිංහලෙන් සභාව ඇමතීම.
- නව රජය හා කැබිනට් මණ්ඩලය වෙනස් වීම.
- මැතිවරණ ව්‍යාපාරයේදී පැවති ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් වූ කරුණු හා විපක්ෂ කණ්ඩායම් ගෙන ආ යෝජනා ජයග්‍රහණය කිරීම මෙරට දේශපාලනය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් වීම.

    - ✓ ආණ්ඩුව වෙනස් කිරීම අවශ්‍ය බව - අනිසි ලෙස බලය පාවිච්චි කිරීම, ධනවාදයට නැඹුරු ප්‍රතිපත්ති ආදිය විවේචනය කිරීම.
    - ✓ සිංහල පමණක් රාජ්‍ය භාෂාව විය යුතු බව - ඉංග්‍රීසි පාසල් හා එම අධ්‍යාපනයට වැඩි තැන ලැබෙන බවට චෝදනා හා ඉංග්‍රීසි උගතුන්ට රජයේ තනතුරු ඒකාධිකාරයක් ඇති බවට චෝදනා ඉදිරිපත් වීම.
    - ✓ බුදු සසුනේ චිරස්ථිතියට කටයුතු කළ යුතු බව - බෞද්ධ කොමිසම, එක්සත් බෞද්ධ පෙරමුණ හා සර් ජෝන්ගේ බෞද්ධ විරෝධී ප්‍රකාශවලට එරෙහිව වචේවන කිරීම.
    - ✓ ආර්ථික ගැටලු පිළිබඳ අවධාරණය කිරීම - සහල් මිල, පාසල් දරුවන්ට දිවා ආහාරය සැපයීම අත්හිටුවීම, සහතික මිල ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම හා ධනවාදී ආර්ථික රටාව පිළිබඳ විවේචන එල්ල වීම.
    - ✓ බ්‍රිතාන්‍ය කිරීටය සමග පැවති ආණ්ඩුක්‍රම හා ගිවිසුම්ගත බැඳීම් ඉවත් කළ යුතු බව - හමුදා කඳවුරු.
- රැස්වීම් හා ගෙන්ගෙට යාම් මගින් ඡන්ද ව්‍යාපාරය සිදුකිරීම.
- අප්‍රේල් 5, 7, 10 දිනවල මැතිවරණය පැවැත්වීම හා එස්.ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන් යුතු මහජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කිරීම.

**(ලකුණු 07 යි)**

****

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!